1 වෙනි පිටුවෙන්.....

අපි කන හැටි ලිපා දනී!

යයි කීවත් එහෙම දෙයක් නැත. දැන් රජය කතා කරන්නේ විශාල ව්‍යාපෘති ගැනය. විශාල පාළම් දැමීම්, වරායවල්, ගුවන් තොටුපළවල් තැනීම්, රට පුරාම ටෙස්ට් ක්‍රිකට් පිටි ඉදිකිරීම් ආදී කාරණ ගැන මිස යුද්ධය කාලේ ජනතාවට තද කරගන්නටයයි කී පටි බුරුල් කරන විදියක් නොවේ. මැතිවරණ කාලේ, ජනපතිවරණ කාලේ දුන් පොරොන්දු ගැන කිසි කතාවක් දැන් නැත.

අත්‍යවශ්‍ය බඩු මිළ ඉහළ නැගීමට හේතුව රජයේ ආදායමෙන් විශාල කොටසක් යුද්ධයට ආයුධ හා යටිතල පහසුකම් සපයන්නටය හමුදාව තව තවත් බඳවාගෙන ඔවුන් නඩත්තුකිරීමටය ආදිය දැන් රජයට කියන්නට බැරිය. දැන් එසේ කළයුතු නැති බව කාටත් පෙනෙන බැවිනි. ලෝක වෙළඳපොළේ තෙල් මිළ ඉහළ යාමයයි කියන්නට ද බැරිවන්නේ අපේ අසල්වැසි රට වන ඉන්දියාවේ එතරම් විසල් ජනගහනයක් ඉන්දැදීත් බොහෝ අත්‍යවශ්‍ය බඩුවල හා කැම්බීම් ආදියේ මිළ ලංකාවේ මිළට වඩා හාත්පසින්ම පහළ මට්ටමක පවතින නිසාය. ලංකාවට බැරිදේ ඉන්දියාවට කළ හැක්කේ කෙසේද? මෙයට සාධාරණ පිළිතුරක් අපේ දේශපාලනඥයින්ගෙන් නොලැබේ.

ලංකාවෙන් ළඟදී ගෙන්වාගත් බඩු මිළ දර්ශණයකි මේ

2010 ජූලි මස 10 දා සිට 26 වෙනිදා දක්වා සති දෙකකදී වියළි ආහාර ද්‍රව්‍ය වල මිළ වෙනස් වූ අයුරුය මේ.

ද්‍රව්‍ය		ජූලි 10	ජූලි 26
සීනි	kg 1	රු 70. 00	80. 00
අල	kg 1	රු 100. 00	120. 00
රටඑනු	kg 1	රු 68. 00	85. 00
කැකුළු හාල්	kg 1	රු 52. 00	59. 00
පරිප්පු	kg 1	රු 150. 00	160. 00
පිටි	kg 1	රු 60. 00	68. 00
බල කරවල	kg 1	රු 550. 00	700. 00
තලපත් මාලු	kg 1	රු 580. 00	640. 00
බෝංචි	kg 1	රු 160. 00	180. 00
කැරට්	kg 1	රු 190. 00	190. 00
අමු මිරිස්	kg 1	රු 160. 00	170. 00
මාලු මිරිස්	kg 1	රු 155. 00	180. 00
කුකුල් මස්	kg 1	රු 400. 00	370. 00
දෙල් ගෙඩිය		රු 160. 00	100. 00
පාන් රාත්තල		රු 36. 00	40. 00
සැමන් ටින් 1 ක්		රු 128. 00	200. 00
බිත්තර 1 ක්		රු 10. 00	13. 00
පොල්තෙල් බෝ 1 ක්		රු 140. 00	150. 00

ඉහතකී ශ්‍රීලංකාවේ බඩු මිළ දර්ශනය පිරික්සූ විට සති දෙකක් ඇතුළත ඒ ද්‍රව්‍ය වැඩිවී ඇති සැටි පෙනේ. මේසේ වැඩිවූ මිළ මඳකින් හෝ පහළ බසින්නේ කළාතුරකිනි. අද අගෝස්තු 10 වන විට තවත් වැඩිවී ඇතුවා නිසැකය. මෙවැනි මිළ වැඩිවීම් මේ තරම් සීඝ්‍රයෙන් ලොව කිසිම රටක සිදු නොවේ. මේ වැඩිවන ප්‍රමාණයට ලංකාමේ මිනිසුන්ගේ පඩිපත වැඩි වී නැත. මේ කිසිවක් ගැන කිසිදු ගාණක් දේශපාලනඥයාට දැනෙනවායයි ඔබ සිතනවාද?

මේ මිළ වැඩිවීමට තවත් හේතුද ඇත. පසුගිය කාලයේ පැවති අධික වර්ෂාව නිසා උඩරටින් එළවළු ලැබුණේ නැත. තිබුණු ප්‍රමාණයන් ගණන් ගියේය. ඉස්සර පාරිභෝගිකයාට අඩුවට භාණ්ඩ අළෙවි කළ සතොස සහ සමුකාර පද්ධති දැන් දූෂණ හා අප්‍රමාණ සේවක පිරිසක් පටවා ගැන්ම නිසා ලාභ නොලබන බංකොලොත් ආයතන වී තිබේ. මේ නිසා බඩු ගෙන්වීමට පුද්ගලික වෙළඳුන්ට සහ සමාගම් වලට ඉඩදී ඇත. එබැවින් පෙර තිබූ මිළ පාලනයක් දැන් නොවේ. මිළ පාලකයින් කියා කොටසක් සිටියත් ඔවුන් කරන පාලනයක් නැත.

එසේම දැන් සාපේක්ෂ මිළ වර්ධනය යයි ප්‍රෝඩා ක්‍රමයක් වෙළෙඳුන් විසින්ම නිර්මාණය කර ඇත. යම් හේතුවකින් එක් ද්‍රව්‍යයක මිළ වැඩිවුවහොත් වැඩි වී නැති අන් ද්‍රව්‍ය සියල්ලේම මිළ ද වැඩි කිරීමයි. මේවා සොයන්නට බලන්නට රජයේ වෙළෙඳ අමාත්‍යාංශය මහන්සි නොවන නිසා කඩකාරයෝ කැමති මිළක් නියම කරති. අනෙක් කාරණය දැන් ලංකාව පුරා බෝ වී ඇති සුපර්මාර්කට් මෝස්තරයයි. ඒවායේ අළෙවි කරන සෑම ද්‍රව්‍යයක්ම ඉස්තරම්ම වර්ගයේ බඩු යයි සිතා මිළ නොවිමසා කියන මුදලක් කරබාගෙන ගෙවීම ලංකාවේ පාරිභෝගිකයා ගේ සිරිත වී ඇත.

වෙළෙඳුන් කියන්නේ තමන් ගෙන්වන බඩු වලට රජය විශාල බදු පණවා ඇති බවයි. ඒ බදු අඩු කළ හොත් අඩුවට බඩු දිය හැකිය කියායි. එහෙත් රජය ඒ පැනවූ බදු අඩුකරන්නට කැමති නැත.

මේ අයුරින් දින දින ඉහළ යන බඩු මිළ නිසා අද ලංකාවේ බහුතර ජනතාව අන්ත අසරණ තත්වය කට වැටී ඇත. අවුරුදු 30 ක් කොටින්ගෙන් අනේක පීඩා විඳි ඔව්හු අද කෙලින්ම ලිපටම වැටී සිටිති.

විකිලීක්ස්? මොනවද මේ විකිලීක්ස්?

දෑ නට සති දෙක තුනකට පෙර බටහිර පුවත් පත් ටීවී හා සෙසු ජනමාධ්‍ය තුළ මහා ආන්දෝලනයක් ඇති කළේ විකි ලීක්ස් යන මේ වචන දෙකය. මුලදී මා සිතුවේ මේ නම් ජානමය විපර්යාසයකට භාජනය කරන ලද ලීක්ස් නම් එළවළු වේ නව ස්වභාවයක් වෙන්නට ඇත කියාය. අද බටහිර ගොවිතැනේ මෙම තාක්ෂණික උපක්‍රමය බෙහෙවින් යොදන බැවිනි. නමුත් විකිලීක්ස් යනු එසේ වචන ලද කෘතිම එළවළුවක් නොවේ.

Wikileaks යනු ඉතා වේගයෙන්, මහා පරිමාණයෙන් සිදුවන කාන්දුවීමයි. අන්තර්ජාලය භාවිතා කරනවානම් එය තුළ ඇති විශ්වකෝෂය හඳුන්වන්නේ විකිපීඩියා යනුවෙන් බව ඔබ දන්නවා ඇත. විකි යන වචනය එහි නිර්මාතෘ ගෙන ඇත්තේ හවායි දූපතේ වැහැරෙන හවායි බසේ විටි යන වචනයෙනි. එය එහි ශබ්ද කරන්නේ විකී යනුවෙනි. එහි අදහස ඉක්මන් හෙවත් වේගවත් යන්නයි. Witi යන්න Wiki වීය. දැන් විකිලීක්ස් යනු වේගයෙන් කාන්දු වී ගලායාමයි.

දැනට ටික කලකට පෙර අන්තර් ජාලය ආශ්‍රිතව ගොඩනැගූ විකීලීක්ස් වෙබ් අඩවියේ මුඛ්‍ය අරමුණ වූයේ ලෝකයේ විවිධ යුද ගැටුම් සිදුවන තැන්වල වන යුදරහස් වශයෙන් ගැනුණු අක්‍රමිකතා සිද්ධීන් එකතුකොට වෙබ් අඩවියේ දක්වා එමගින් ලෙස ඉදිරියට එවන් අක්‍රමිකතා ලොව සිදුවීම වැලැක්වීමටය. මෙසේ රැස්කරගත් දත්ත සහ බුද්ධි වාර්තා **(intelegence reports)** 90000 ක සංඛ්‍යාවක් සැකසුම් කොට ප්‍රසිද්ධ කිරීමට කටයුතු යොදා ඇත. මෙය ඇමරිකා එක්සත් ජනපදයෙහි මින් පෙර කිසි කළෙක නොවූ විරූ යුද රහස් කාන්දුවීමක් වනු නොඅනුමානය. ඒ සියළු දත්ත ගොණු බ්‍රිතාන්‍යයේ ගාඩියන්, ඇමරිකාවේ නිව්යෝර්ක් ටයිම්ස්, ජර්මණියේ ඩෙයර් ස්පීගල් යන වගකිව යුතු පුවත්පත් මගින් පසුගිය වර්ෂ හය තුළ **2004-2009** දක්වා ඇප්ඝනිස්ථාන් යුද්ධය ගැන වාර්තා පූර්ණ ලෙස පළකිරීමට කටයුතු යොදා ඇත.

බැරක් ඔබාමා ඇප්ඝනිස්ථාන් සටන තීව්‍රකිරීමේ වෑයම ඵල රහිත බවට සැක මතුවී ඇති මේ මොහොතේ මේ කාන්දු වූ වාර්තා එළියට පිටවීම ඇමරිකාවට බලවත් පහරක් වී තිබේ.

මේ යුදමය ලොග් සටහන් සවිස්තරව පෙන්වා දෙන කරුණු අතර කීපයක් මෙහි දක්වමු:

1. තලේබාන් නායකයින්ව විහාග නොපවත්වා අල්ලා ගැනීමට හෝ මරාදැමීමට හෝ අරමුණු කරගත් කළු ඒකකයක් **(black unit)** ඇමරිකාව පිහිටුවා ඇති අකාරය.

2. හු මට්ටමේ සිට ගුවනට යැවිය හැකි මාරාන්තික මිසයිල් අවි තලේබාන් කාරයින් සපයාගෙන ඇති ආකාරය තම ලැජ්ජාව වසාගැන්මට ඇමරිකාව හොර රහසේම යටගසා ඇති අකාරය.

3. තලේබාන්වරුන් දුරසිට දඩයම් කිරීමට ඇමරිකාවේ නිවේඩා කාන්තාර මධ්‍යස්ථානයක සිට දුරස්ථ පාලනය මගින් රීපර් ඩ්‍රෝන්ස් නමැති නියමු රහිත ගුවන් යානා වැඩි වැඩියෙන් යොදා ගන්නා ආකාරය.

Wiki-Leaks *founder* Julian Assange

4. මේ වන විට සිවිල් වැසියන් 2000 කට වඩා බිලිගනිමින් තලේබානුන් විසින් සාහසික ලෙස කරනු ලබන ජීවිත විනාශ ගැන පැහැදිලි වාර්තා.

මීට අමතරව බටහිර හමුදාවන් විසින් යොදාගෙන ඇති සිවිල් වැසි යන්ට හානිකර වූ ක්‍රියාදාමයන් රැසක් මේ ලොග් සටහන් වලින් එළිදරව්වී තිබේ. දහස් සංඛ්‍යාත මෙවැනි කාරණා සවිස්තරව එහි ඇත. මේ සියල්ලෙන් හෙළිවන්නේ බටහිර රටවල ප්‍රෝඩාකාරී හෙළුව නොවේද?

විකිලීක්ස් කාගේ වැඩක්ද? අරමුණු මොනවාද ?

මෙහි නායකත්වය දරන්නේ ඊලියන් අසන්ජේ නම් 39 වියැති ඕස්ට්‍රේලියානු ජාතිකයෙකි. මෙය ධනය ඉපයීමේ අරමුණින් ආරම්භ කළ කාර්‍යයක් නොවේ. හුදෙක් සත්‍ය කරුණු ගවේෂණ ය කොට අක්‍රමිකතාවන් ලෝකයේ අවධානයට යොමුකොට එමගින් සමාජ ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණ පමණක් ඇතිවය. මෙම සංවිධානයට අයත් සියල්ලෝ පඩියට නොව ස්වේච්ඡාවෙන් වැඩකරන අය වෙති. පිරිසිදු අරමුණකින් මොවුන් කටයුතු කරන බැවින් ඇමරිකාවට හා බ්‍රිතාන්‍යයට කට උත්තර නැතිවී ඇත. ඒ දෙරට ප්‍රමුඛ බටහිර රට වල් ඉරාකය ඇප්ඝනිස්ථානය වැනි යුද්ධ වල යෙදෙන්නේ උතුම් අරමුණකින්ය යන කඩතුරාවට මුවාවීය. දැන් විකිලීක්ස් ඒ කඩතුරාව ඉරා දමා මේ රටවල සැබෑ මුහුණුවර ලොවට දක්වා තිබේ. මෙය බළලා ගලේ පහරා ඇති ආකාරය යෝධ ටෝච් එළියක් ගසා විදහා පෙන්වීමකි.

විකිලීක්ස් වලින් ලෝකයාට ගතහැකි පාඩම්

අද ජනසංනිවේදන මාධ්‍යවල අදහස් හුවමාරුවේ ඇතිවී තිබෙන විප්ලවය නිසා කාටවත් හැංගිහොරා කටයුතු කරන්නට බැරි බවයි. විශ්ව ගම්මානය තුළ හොර වැඩ බැරි බවයි. ඉක්මනින් හෝ ප්‍රමාද වී හෝ ඒවා එළිවන බැවිනි. බටහිර රටවල් ඇප්ඝනිස්ථානය තුළ ගෙනයන හොර පිළිවෙත දැන් මනාසේ එළිවී ඇත. ඇමරිකාවට හා බ්‍රිතාන්‍යයට තමන් සුදනන් බව මින්පසු පෙන්වන්නට බැරිය. මෙය අන්තර්ජාතික වශයෙන් මෙන්ම රටක් ඇතුළත වුවද සත්‍යයකි. ආණ්ඩු කොපමණ හොර රහසේ කටයුතු කළත් ඒවා යම් දිනක හෙළිවන්නේය.

අපේ රටට විකිලීක්ස් වලින් ඇති විශේෂ වැදගත්කම

මේ සිදුවීම් අප රටට මේ අවස්ථාවේ අතිශය වැදගත් කමෙන් යුක්තය. ඇමරිකාව සහ මහා බ්‍රිතාන්‍යය සති කීපයකට පෙර එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන්කිමූන්ද අල්ලාගෙන ශ්‍රීලංකාවට විත කටින අදහසින් ඊළම් යුද්ධයේ අවසාන කොටසේදී අපේ යුද කටයුතුවල අක්‍රමිකතාවන් ගැන බොරු චෝදනා නගමින් විභාගකිරීමට විශේෂ කොමිටියක් පත් කළහ. ඔවුන් අති සුදනන් වූ අතර, වුදිතයෝ අපි වීමු. නමුත් දැන් ඊට වඩා එහාට යන චෝදනා රාශියක් ඇමරිකා-වට සහ බ්‍රිතාන්‍යයට එල්ලවී ඇත. සාක්ෂිද එමට ඇත. කට උත්තර නැති මොවුන් දැන් කියන්නේ යුද්ධයකදී එවැනි දේ සිදුවීම ස්වාභාවික බවය.

දැන් අප මැණිය යුත්තේ ඒ අනුව බලන විට අප කොපමණ පිරිසිදු සටනක් ගෙනගියාදැයි යන්නය. සැබැවින්ම අප හමුදාවන් අහිංසක සිවිල් වැසියන්ට හිරිහැරවත් කළ බවට චෝදනා නැත. ඇත්තේ සාක්ෂිවත් සැපයිය නොහැකි බොරු චෝදනා පමණි. මේවා මතුකර ලමින් අප ඇමරිකාවට, බ්‍රිතාන්‍යයට, බැන්කි මූන්ට හා නවී පිල්ලේ ආදීන්ට කියන්නේ ලැජ්ජා නැති ලෙස හැසිරෙන්නේ නැතුව අපට කළ චෝදනා ඉල්ලා අස්කරගෙන අපේ ජනතාවගෙන් සමාව අයදින ලෙසය. ඒ පත්කර ඇති කමිටුව වහා විසුරුවා හරින ලෙසය.

♦ ***වකුල ගුණපාල*** **Ilford Essex UK**

ඩෙංගු උවදුර



ඩෙංගු මදුරුවා

ඩෙංගු රෝගය ඉතා අවාසනාවන්ත ලෙස ඉතා සීඝ්‍රයෙන් පැතිරයමින් එය අප රටේ ජනතාවගේ දෛනික ජීවිතයට දැන් ඉමහත් ලෙස තර්ජනයක්ව ඇත.

එහෙත් තවම අප රටේ වගකිව යුතු ලොක්කන් මෙය කිසිම ගණනකට ගත් බවක් නොපෙනේ. එසේත් නැතිනම් ඔවුන් මෙය විසාල වසංගතයක් වී පාලනය කරගන්නට බැරි තත්වයක් දක්වා පැතිරී යන තුරුත් තවමත් සුදුසු පිළියම් ගැන කල්පනා කරමින් සිටිනවා විය හැකි ය.

උදාහරණයක් වශයෙන් කිවහොත් දැන් අවුරුද්දකටත් වැඩිඩි කාලයක් පුරා ඩෙංගු මර්දනයට යොදාගන්නා විශේෂ රසායනික ද්‍රව්‍යයක් වන ඊඕෂ නම් බෙහෙත කෙහේදෝ රටකින් ගෙන්වා ලංකාවේ විදිනවායයි කීවත් තවම එසේ කර නැත. එසේ ප්‍රමාදවීමට හේතු වශයෙන් නොයෙක් හේතු දක්වතත් ඩෙංගුවෙන් අප රටේ වී ඇති මරණ සංඛ්‍යාවට ඒ හේතු වලින් වැඩක් ඇද්ද?

ශ්‍රීලංකාවේ ප්‍රධාන පුවත්පතක සති දෙකකට පෙර පළවූ පුවතක වූයේ ශ්‍රීලංකාවේ රෝග ව්‍යාප්ත මර්දන ඒකකයේ දත්ත අනුව ඒ වන විට ඩෙංගු රෝගයෙන් රටපුරා **164** දෙනෙකු මියගොස් ඇති බවයි. ඊට කලින් සතියේ රට පුරා ඩෙංගු වැළඳුණු රෝගීන් **22,998** ක් වාර්තා වී ඇති අතර ඉන් **3710** ක්ම කොළඹ වාසීහු වෙති. අද ඩෙංගු රෝගය අප රටේ නිදන්ගත රෝගයක් බවට පත්ව ඇති බව පෙනේ. අවුරුදු ගණනකට පෙර මැලේරියා රෝගය ලංකාවේ තුරන්කරන්නට බැරි මහා වසංගත යක්ව තිබුණු හැටි අප අසා ඇත. එය අවසන් වූයේ දශක ගණනාවක් අතිශය අමාරුවෙන් නොයෙක් උපක්‍රම හා බෙහෙත් භාවිතයෙන්ද, රෝගය සහ රෝග වළක්වන ආකාරය ගැන ජනතාව පූර්ණව දැනුවත් කිරීමෙනි. එකල පාලකයින් වහා ක්‍රියාකාරීවීමෙනි.

දැන් අවශ්‍යව ඇත්තේ විශේෂ කාර්ය බලකායක් මේ වෙනුවෙන්ම සාදා හැකි ඉක්මනින් ක්‍රියාත්මක වීමයි. එසේ නැතිව එක් උප ඇමතිවරයෙකු කළාක් මෙන් නිලධා රියෙකු අල්ලා ගහකට තබා බැඳීමෙන් නොවේ. රජය ඩෙංගු සඳහා හමුදාවද පොලීසියද යොදවා ඇති බව කිය තත් එය විධිමත්ව කර ඇති බවක් නොපෙනේ. අවශ්‍ය වන්නේ කෙනෙකු ගහක බැඳීම වැනි පිස්සු පාට් නොව ආදර්ශයෙන්ම ක්‍රියාත්මක වීමය. ඒ ඇමතිවරයාට තිබුණේ නිළධාරීන් පිරිවරා ඉදල් කොහු බුරුසු ගෙන පළාතේ මිනි සුන්ද සමග දිය අගල් කසල ගොඩවල් වැනි මදුරුවන් ගැවසෙන තැන් සුද්ධ පවිත්‍ර කරන්නට පෙරමුණ ගැනීමය.

1960 දශකයේ චීනයේ මහාමාරිය, ජලභීතිකා ආදී වසංගත රැසක් වැළඳී ජනතාව මිය යන කල ජනාධිපති මාවෝ සේතුං රටපුරා යමින් ඒ උවදුරු නසන්නට ක්‍රියා කළ සැටිත් ඒවා හරියටම හරිගිය හැටිත් අපි දුටුවෙමු. ශ්‍රී ලංකාවටද දැන් අවශ්‍ය එවැනි ක්‍රියාශීලී මැති ඇමතිවරුය.

- සංජය